## සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරින්ගේ කළමනාකරණ සහකාර-තාක්ෂණ ඛණ්ඩ 2 (MT 2 - 2025 ) සේවා ගණයේ III ශ්‍රේණියේ ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය -2026

සබරගමුව පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවෙහි ක්‍රීඩා නිලධාරී III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා 2026.02.12 දිනට වයස අවුරුදු 18 ට වැඩි සහ 35ට නොවැඩි සුදුසුකම් ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය 2026 පෙබරවාරි මාසයේ දී පවත්වනු ලැබේ.

01. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය :- 2026.02.12

02. පුරප්පාඩු සංඛ්‍යාව :- 05

03. බඳවා ගැනීමේ සුදුසුකම්:-

3.1 අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තිය සුදුසුකම්

(අ)

I. මව්බස (සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත් වී තිබීම

සහ

II. අධ්‍යයන පොදු සහතික (උසස් පෙළ) විභාගයේ සියලුම විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාගෙන තිබීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හා සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර)

සහ

III. ක්‍රීඩා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන ජාතික මහා ක්‍රීඩා උළෙලේ පළාත් මට්ටමින් (දිස්ත්‍රික් අතර) පැවැත්වෙන තරඟයන්හි දී 1 හෝ 2 ස්ථානයන් ලබා තිබීම, ජාතික මහා ක්‍රීඩා උළෙලේ 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම, ක්‍රීඩා පනත යටතේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් පවත්වනු ලබන ජාතික ශූරතා තරඟවල 1, 2 හෝ 3 ස්ථාන ලබා තිබීම.

හෝ

(ආ) I. මව්බස (සිංහල / දෙමළ / ඉංග්‍රීසි භාෂාව), ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක්වරක දී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ ) විභාගය සමත් වී තිබීම.

සහ

II. දකුණු ආසියාතික තරඟ, ආසියාතික තරඟ, පොදු රාජ්‍ය මණ්ඩලීය තරඟ, ලෝක ශූරතා තරඟ හෝ ඔලිම්පික් තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කර තිබීම.

**04.** **පොදු සුදුසුකම්**

(අ) **2026.02.12** දිනට අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු වන අතර, අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර තුන තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ ස්ථිර පදිංචිය නොමැති නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය.

(ආ) අයදුම්කරු විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

(ඇ) ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතු ය.

(ඇ) 2026.02.12 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට **වයස අවු. 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.**

**05.** **මෙම තනතුරට අදාළ වැටුප් පරිමාණය**

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව කළමනාකරණ සහකාර- තාක්ෂණ බණ්ඩ 2 (MT 2-2025) වැටුප් කාණ්ඩය MT –02-2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු:50,630-10X630-11X670-10X1010-10X1190-86,300/- වේ. මෙයට අමතරව රජයේ නිලධරයන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද හිමි වේ.

**06.** **මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.**

**07.** **බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත පරීක්ෂණයක් සහ වෘත්තීය පරීක්ෂණයක් පවත්වනු ලබන අතර එමගින් ලබා ගන්නා ප්‍රතිඵල අනුව අයදුම්කරුවන් විසින් ලබා ගන්නා ලකුණුවල ප්‍රමුඛතාවය මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධාන ද අනුගමනය කරමින් කුසලතාවය පදනම් කර ගනිමින් පවත්නා පුරප්පාඩු ගණනට සමාන පිරිසක් බඳවා ගනු ලැබේ.

සටහන:-

ලිඛිත තරඟ විභාගයෙන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත, බඳවා ගැනීමට නියමිත පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වෘත්තීය පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

වෘත්තීය පරීක්ෂණය සඳහා යොමු කළ අයදුම්කරුවන් සියලු දෙනා මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එම අයදුම්කරුවන් විසින් ලිඛිත තරඟ විභාගයේ සහ වෘත්තීය පරීක්ෂණයේ ලබා ගන්නා ලකුණුවල එකතුවෙහි කුසලතා අනුපිළිවෙල මත පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

08.I. ලිඛිත විභාගයේ විෂය නිර්දේශය:-

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|
| 01.අභියෝග්‍යතාවය හා සාමාන්‍ය දැනීම | තර්කන ශක්තිය/ ගැටලු නිරාකරණය / සාමාන්‍ය බුද්ධිය මැනීම සඳහා වන ප්‍රශ්න සහ ලංකාවේ ඓතිහාසික, භූගෝලීය, සාමාජීය ආර්ථිකය හා දේශපාලනමය වශයෙන් වැදගත් සිදුවීම්, තොරතුරු පිළිබඳව හා දේශීය හා විදේශීය වශයෙන් ක්‍රීඩා ක්ෂේත්‍රය ආශ්‍රිත කාලීන තොරතුරු මෙන්ම මළල ක්‍රීඩා හා කණ්ඩායම් ක්‍රීඩා පිළිබඳව මූලික නීති රීති පිළිබඳව දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත බහුවරණ හා කෙටි ප්‍රශ්න සහිත ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 1/2 | 100 | 40% |
| 2.භාෂා හැකියාව | අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, ව්‍යාකරණ භාවිතය, භාෂාව හා රචනය පිළිබඳව දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්නවලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි. | පැය 01 | 100 | 40% |

මෙම විභාගය සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව විභාගය පවත්වන නගරය තීරණය කරනු ලැබේ. විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා වලංගු ජාතික හැඳුනුම්පත හෝ වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

08.II. වෘත්තීය පරීක්ෂණය

| අනු අංකය | පරීක්ෂණය/විෂය ක්ෂේත්‍රය | උපරිම මුළු ලකුණ | සමත් ලකුණ |
|---|---|---|---|
| 01 | Drop stick (ප්‍රතික්‍රියා වේගය මැනීම) | 12.5 | 05 |
| 02 | Dips (ශරීර ශක්තිය මැනීම) | 12.5 | 05 |
| 03 | Sit-ups (උදරයේ මාංශ පේශිවල ශක්තිය මැනීම) | 12.5 | 05 |
| 04 | පහළට නැමීමේ පරීක්ෂණය (sit & reach) - නම්‍යතාව මැනීම | 12.5 | 05 |
| 05 | හිටිදුර පැනීමේ පරීක්ෂණය (standing long jump) පාදවල ශක්තිය මැනීම | 12.5 | 05 |
| 06 | Shuttle run (ක්ෂණිකව ඉරියව් වෙනස් කිරීමේ හැකියාව මැනීම) | 12.5 | 05 |
| 07 | මීටර් 60 වේග ධාවන පරීක්ෂණය (60m sprint) - වේගය මැනීම | 12.5 | 05 |
| 08 | මීටර් 1000 ධාවන පරීක්ෂණය (1000m Run) දරාගැනීමේ හැකියාව මැනීම | 12.5 | 05 |
| | මුළු ලකුණ | 100 | 40% |

- ඉහත අංග 08 සඳහා වෘත්තියමය ක්‍රමවේදයකට පරීක්ෂණ පවත්වා ලකුණු පිරිනමනු ලැබේ.

වෘත්තිය පරීක්ෂණය සඳහා විෂය නිර්දේශය

| පරීක්ෂණය/විෂය ක්ෂේත්‍රය | අරමුණ | පරීක්ෂණ ක්‍රමය | ලකුණු ලබාදීම |
|---|---|---|---|
| **Drop stick** (ප්‍රතික්‍රියා වේගය මැනීම) | ප්‍රතික්‍රියා වේගය මැනීම | • මීටර් කෝදුවක් ගෙන පරීක්ෂණයට ලක්වන්නාගේ හුරු අත නිශ්චලව තබා ඇඟිලි විහිදා එයට ස්පර්ශ වන සේ තබා විධානයත් සමඟ කෝදුව අතහරින අතර එය ක්ෂණිකව අල්ලා ගත යුතු ය. | • පරීක්ෂාවට ලක්වන්නාගේ අත්ලේ පහළ සිට කෝදුව පහළට වැටෙන ප්‍රමාණය ආසන්න සෙන්ටිමීටරයට මැන ගැනීම. |
| **Dips** (ශරීර ශක්තිය මැනීම) | උදර පේශි ශක්තිය බාහු ශක්තිය | <u>පිරිමි</u><br>• පොළව මත දිග ඇදී පාද ඇඟිලි හා අත්ල පොළොවට සිටිනසේ ශරීරයේ බර දරා ගනිමින් අත් හා පාද මගින් ශරීරය ඉහළට හා පහළට චලනය කෙරෙන වාර ගණන ගණනය කිරීම.<br><u>කාන්තා</u><br>• ඉහත ව්‍යායාම කාන්තාවන් සඳහා අත්ල හා පාදවල දණහිස් මත සිට ඉහත චලනයන් සිදු කරයි.<br>• ශරීරය චලනය කිරීමේ ඉරියව්ව පොළොවට සමාන්තරව ඉහළ පහළ ගෙන යා යුතු ය. | • ආරම්භක සංඥාවක් සමඟ තත්පර 30ක කාලයක් තුළ වැඩිම වාර සංඛ්‍යාවක් නිවැරදි චලනයන් සිදු කිරීම. |
| **Sit-ups** (උදරයේ මාංශ පේශිවල ශක්තිය මැනීම) | උදර පේශි ශක්තිය | • බිම වාඩි වී පාද දණහිසින් නමා ශරීරය ආසන්නයට පාද විලුඹ ගෙන දෙඅත්, හිස පිටුපස තබා ගන්නා ආරම්භක ඉරියව්වේ සිට ශරීරයේ ඉහළ කොටස පිටුපසට හා නැමුණු දණහිස් දෙසට චලනය කිරීම. | • ආරම්භක සංඥාවක් සමඟ නිවැරදි ඉරියව්වෙන් තත්පර 30ක් ඇතුළත සිදුකෙරෙන චලන වාර සංඛ්‍යාව ගණනය කිරීම. |
| පහළට නැමීමේ පරීක්ෂණය **(sit & reach)**- (නම්‍යතාවය මැනීම) | නම්‍යතාව මැනීම **(Flexibility)** | • සෙ.මී 20 ක් උස පෙට්ටිය මත සිට ගැනීම.<br>• මිණුම් පටිය ඔස්සේ දැත් හැකි තරම් පහළට ගෙනයාම.<br>• ශරීරය පහළට ගෙන ගොස් දැත් නවතින ස්ථානය සලකුණු කරගැනිම. එහි තත්පර 2ක් රැඳී සිටිය යුතුය. | • ආරම්භක අවස්ථාවේ සිට ශරීරය නැමීම මගින් මිණුම් පටියේ සලකුණු කෙරෙන උපරිමය ආසන්න සෙන්ටිමීටරයට සටහන් කිරීම. |

| | | | |
|---|---|---|---|
| හිටිදුර පැනීමේ පරීක්ෂණය **(standing Broad jump)** (නම්‍යතාවය මැනීම) | පාදවල ක්ෂණික ශක්තිය මැනීම **(Explosive Leg Power)** | • ආරම්භක රේඛාව ස්පර්ශ නොවන සේ දෙපා එක්ව තබා රේඛාවට පිටුපසින් සිටගැනීම.<br>• දණහිස් මදක් නැමීමත් සමඟ දෑත් ඉදිරියට යොමු කිරීමත් සමඟ හැකිතාක් දුරට පැනීම. | • ආරම්භක රේඛාවේ සිට පැනීමේදී ආසන්නම පතිත වූ පාදයේ විලුඹ දක්වා දුර මැනීම. එය ආසන්නම සෙ.මී. 0.1ට ගණනය කිරීම.<br>• අවස්ථා තුනක් ලබා දී උපරිම දක්ෂතාවය සටහන් කර ගැනීම. |
| **Shuttle run** (ක්ෂණිකව ඉරියව් වෙනස් කිරීමේ හැකියාව මැනීම) | වේගය හා උලනිතාවය මැනීම **(speed & agility)** | • මී.10ක් ධාවන මගක් සලකුණු කර ගැනීම.<br>• ආරම්භක රේඛාව ස්පර්ශ නොවන සේ රේඛාවට පිටුපසින් සිටගැනීම.<br>• ආරම්භක විධානයට ක්‍රීඩකයා හිටි ඇරඹුමෙන් ඉදිරියේ සලකුණු කර ඇති මී. 10 සීමාව අල්ලා නැවත ආරම්භක සීමාවට දිවගොස් එම ස්ථානය ද ඇල්ලීම.<br>• නැවතත් ඉදිරියට දිවගොස් ඉදිරියේ සලකුණු කළ සීමාව ස්පර්ශ කර ආපසු ආරම්භක සීමාව ස්පර්ශ කිරීම. | • ඉහත ක්‍රියාකාරකම සඳහා ගත වූ කාලය සටහන් කරගැනීම.<br>• තත්පර 0.01 කට කාලය ගණනය කිරීම. |
| මීටර් 60 වේග ධාවන පරීක්ෂණය **(60m sprint)-** (වේගය මැනීම) | ප්‍රතික්‍රියා වේගය හා ත්වරණය මැනීම **(speed acceleration)** | • මී.60 සීමාව සලකුණු කිරීම.<br>• ආරම්භක රේඛාවේ පසුපසින් ක්‍රීඩකයා සිටගැනීම.<br>• සැරසෙන් විධානය අනුව ඔවුන් හිටි ඇරඹුම් ඉරියව්වට පැමිණීම.<br>• ආරම්භක සංඥාව අනුව වේගයෙන් ඉදිරියට ධාවනය කිරීම<br>• ආරම්භක සංඥාවට විරාම සටිකාව ක්‍රියාත්මක කිරීම. | • අවසාන රේඛාව ක්‍රීඩකයා යොමු වූ මොහොත දුටු විගස විරාම සටිකාව නතර කර ගතවූ කාලය සටහන් කර ගැනීම. කාලය අවසන් තත්පර 0.01ට ගණනය කිරීම |
| මීටර් 1000 ධාවන පරීක්ෂණය **(1000m Run)** (දරාගැනීමේ හැකියාව මැනීම) | වේගය හා දරා ගැනීම මැනීම | • මී.400 ධාවන පථයක මී.1000ක දුරක් දිවීමට සැලැස්වීම. | • කණ්ඩායම් වශයෙන් ධාවනයේ යෙදීමට සලස්වා විරාම සටිකාව මඟින් ධාවනය සඳහා ගත වූ කාලය ගණනය කිරීම. |

**09. අයදුම් කිරීමේ ක්‍රමය**

9.1. මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ-4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද අංක 04 සිට 06 තෙක් දෙවන හා තුන්වන පිටුවට ද වශයෙන් ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.2. විභාග ගාස්තුව **රු.600/-** කි. **මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ 20.03.02.99 දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස** සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. ඉහත සඳහන් ආයතනවලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු, පළාත් පාලන ආයතන) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.

9.3. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් **2026.02.12** දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි ක්‍රීඩා නිලධාරි III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය-2026"** යනුවෙන් සඳහන් කළ යුතු ය. නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත්, තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් පූර්ව දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

9.4. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වේනොත් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය. මෙහි සිංහල හා දෙමළ නිවේදන අතර **කිසියම් අනනුකූලතාවයක් පවතී නම් එවැනි විටක සිංහල මාධ්‍යය නිවේදනය අනුව කටයුතු කරනු ලැබේ.** එසේම මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතුවේ.

ඩබ්.ආර්.දිනීෂා එස්.රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
2026.01. 09

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත.

# ආදර්ශ අයදුම්පත්‍රය

**සබරගමුව පළාත් රාජ්‍ය සේවයෙහි ක්‍රීඩා ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ කළමනාකරණ සහකාර සහකාර-තාක්ෂණ ඛණ්ඩ 2 (MT 2-2025 ) සේවා ගණයේ III ශ්‍රේණිය ක්‍රීඩා නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය-2026**

---

| |
|---|
| |

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාල අංකය කොටුව තුළ ලියන්න ) ☐
සිංහල - 1
දෙමළ - 2

විභාගයට පෙනීසිටීමට කැමති නගරය
රත්නපුර ☐
කෑගල්ල ☐

01\. අ. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :-...........................................................
..............................................................................................................
..............................................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා : GUNAWARDHANA, M.G.B.S.K.)

ආ. සම්පූර්ණ නම:-................................................................................................
..............................................................................................................
( සිංහලෙන් / දෙමළෙන්)

ඇ. සම්පූර්ණ නම :-................................................................................................
..............................................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය:-

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

ඉ. දුරකථන අංකය:-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02\. I. ස්ථිර ලිපිනය :-.......................................................................
.......................................................................

II විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය-.......................................................................
.......................................................................

III. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- රත්නපුර ☐ කෑගල්ල ☐

IV. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන **2026.02.12** දිනට සබරගමුව පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව
අවුරුදු ☐ මාස ☐ දින ☐

ඔබ සබරගමුව පළාතේ පදිංචි කරුවකු නොවේ නම් කලත්‍රයා සබරගමුව පළාතේ පදිංචි අයකුදැයි සඳහන් කරන්න.......................................................................................................

03\. I. ස්ත්‍රී/ පුරුෂ භාවය :- ☐
ස්ත්‍රී-1, පුරුෂ-0
(අදාල අංකය කොටුව තුල ලියන්න.)

II. උපන්දිනය :- වර්ෂය ☐ මාසය ☐ දිනය ☐

III. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන **2026.02.12** දිනට වයස :-
අවුරුදු ☐ මාස ☐ දින ☐

04. අධ්‍යාපන සුදුසුකම්

4.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් ඇමිණිය යුතු යි)

වර්ෂය:-.............................. විභාග අංකය:-..............................

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

4.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර (ප්‍රතිඵල ලේඛනයේ ඡායා පිටපතක් ඇමිණිය යුතු යි )

වර්ෂය:-.............................. විභාග අංකය:-..............................

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |
| | |

4.3. වෘත්තිය සුදුසුකම්

බඳවා ගැනීම් නිවේදනයට අනුව ඔබ ලබාගත් දේශීය තරඟ ජයග්‍රහණ හා ජාත්‍යන්තර තරඟ සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කිරීම් හෝ ජයග්‍රහණ වලට අදාළ විස්තර .

........................................................................................................................................................
........................................................................................................................................................
........................................................................................................................................................

(සනාථ කිරීම සඳහා අදාළ සහතිකවල ඡායා පිටපතක් අමුණන්න. )

05. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය :- ………………………………..
විභාග ගාස්තු ගෙවූ කාර්යාලය:-.................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

06. අයදුම්කරුගේ සහතිකය

............................................................වන මා විසින් මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යයි සොයාගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නෙසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.......................................
දිනය:- අයදුම්කරුගේ අත්සන

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
**( අනවශ්‍ය වචන කපා හරින්න )**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ........................................................ මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය .................................... දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:-

අත්සන :-...........................................................
තනතුර හා නිල මුද්‍රාව

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු,හෝ රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා**
**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ( අනවශ්‍ය වචන කපා හරින්න )**

..................................................................................මයා/මිය/මෙනවිය දැනට ................................................ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ........................................................ වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහුට / ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු / ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

දිනය :- ...........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
( නිල මුද්‍රාව තබන්න)